# Living the Lotus

7
2021

VOL. 190

Buddhism in Everyday Life




## Founder's Reflections

## අත්නොහැර විශ්වාසය තබා ගැනීම

දරුවන්ව අනිවාර්යයෙන්ම විශ්වාස කරන කෙනෙක් සමිපයේ සිටිම, දරුවන්ගේ වර්ධනයට අත්‍යාවශය වේ. නිකමට හෝ දරුවා වැරදි මාර්ගයක ගියත්, දෙමාපියන් තම දරුවාව විශ්වාස කල යුතුය. මන්ද, එම දැඩි විශ්වාසය දරුවාට සහනය ගෙන දෙන අවසන් බලාපොරොත්තුව වනවා සේම, යළි නැගීටීමට අවශ්‍ය ශක්තිය ලබා දෙන නිසාය.

හොද දරුවාව පමණක් විශ්වාස කර, නරක වැඩ කර දරුවවා විශ්වාස නොකරයි නම්, එය නියම විශ්වාසයද නොවේ. කොපමණ අකීකරු වී, ද්‍රෝහි වැඩ කලත් දරුවාගේ බුද්ධ ශක්තිය තදින්ම විශ්වාස කිරීමයි, නියම විශ්වාසය වන්නේ.

අගර්හීත බෝධිසත්වයන් වහන්සේව මතකයට නගා ගන්න. උන් වහන්සේ තමන්ට දෝෂාරෝපණය කරන හා ගල් මුගුරු වලින් පහර දෙන පුද්ගලයන්ව පවා ගෞරව වන්දනා කලා. මේ මොහොතේ වැරදි වැඩ කලත්, එය තාවකාලික ස්වරූපය වේ. අවසානට බුදුන්ගේ දරුවෙක් යන නියම ස්වරූපය ඉස්මතු වී, අවසානයට බුදු බවට පත්වන බව විශ්වාස කලා.

එසේම දරුවන් වැරදි වැඩ කලත්, ඒ දෙස තමා බලන ආකාරය වෙනස් කර ගැනීම තුලින් අනිවාර්යයෙන්ම දරුවන්ගේ හොදක් සොයා ගැනීමට හැකිවේවී. එබැවින් අත් නොහැර විශ්වාසය තබා ගැනීමයි, නියම විශ්වාසය වන්නේ. අපිරිසිදු බවින් නැහැවී තිබුණත්, එහි අතුලාන්තයේ පිරිසිදු හදවත නිදා සිටියි. එය සොයා ගැනීමට හැකිවන්නේ ගෞරව වන්දනා කිරීමට ගන්නා උත්සහය මතයි.

නිර්මාතෘ සංකල්පනා ග්‍රන්ථය ඇසුරිනි. 10, P. 142-143


රිෂ්ෂෝ කෝසෙයි සංවිධානය 1938 වර්ෂයේදි නික්යෝ නිවානෝ තුමා හා මියාකෝ නගනුමා මහත්මිය විසින් ස්ථාපිත කරන ලදී. සද්ධර්ම පුණ්ඩරීක සුත්‍රය මුලික කරගෙන එහි කටයුතු කරනු ලැබේ. පවුල තුලත්, කාර්යාලයේදීත්, සමාජයේදීත් බුදු දහම ජීවිතයට බද්ධ කර ගෙන, සාමාකාමි ලෝවක් බිහි කිරීමට ප්‍රාර්ථනා කර කටයුතු කරන එකමුතුවකි.

වර්තමානයේදී නිචිකෝ නිවානෝ ප්‍රධානීතුමාගේ මුලිකත්වයෙන්, සාමාජික සාමාජිකාවන් සැම ධර්ම ව්‍යාප්තියේ යෙදෙමින් අත් වැල් බැදගෙන සෑම රටකම සාම ක්‍රියාකාරකම් වල නියැලි සිටියි.

Living the Lotus
Vol. 190 (July 2021)

Senior Editor: Keiichi Akagawa
Editor: Kensuke Osada
Copy Editors: P.A.D. Somapala, Ruklanthi Palipana, Sahan Chamara

*Living the Lotus* is published monthly by Rissho Kosei-kai International, Fumon Media Center, 2-7-1 Wada, Suginami-ku, Tokyo 166-8537, Japan.
TEL: +81-3-5341-1124
FAX: +81-3-5341-1224
Email: living.the.lotus.rk-international@kosei-kai.or.jp

Living the Lotus-Buddhism in Everyday Life (සද්ධර්ම පුණ්ඩරීක සුත්‍රය තුල ජීවත්වෙමු - එදිනෙදා දිවියට බුදු දහම බද්ධ කර ගනිමු.) යන තේමාව තුල, එදිනෙදා ජිවිතයට සද්ධර්ම පුණ්ඩරීක සුත්‍රයේ කියාදීම් බද්ධ කර ගෙන මඩෙහි පිපෙන්නාවු ලස්සන නෙලුම් මලක් සේ තම ජිවිතය සමෘධිමත් කරගෙන, එලෙසම වැඩි වටිනාකමින් යුතු තත්වයට පත් විය යුතුය යන ප්‍රාර්ථනය ගැබ් වී ඇත. මෙම සඟරාව මගින් ලෝකය පුරා ව්‍යාප්ත වී සිටින්නාවු සාමාජික සාමාජිකාවන් එදිනෙදා දිවියට බුදුදහම බද්ධ කරගෙන කටයුතු කරන්නාවු අයුරු අන්තර්ජාල මාර්ගයෙන් බෙදහැරීම සිදු කරනු ලැබේ.

*President's Message*



# දයාවේ දෑසින් යුතුව

**නිචිකෝ නිවානෝ තුමා**
**ප්‍රධානී, රිෂ්ෂෝ කෝසෙයි සංවිධානය**

## 'සියළු සත්වයන් දෙස කාරුණික දෑසින් බැලීම' යනු

සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ 25 වන පරදුක්ඛ දුක්ඛිත බෝධිසත්වයන්ගේ පරිච්ඡේදයේ 'සැම දෙන දෙස බලයි කාරුණික දෑසින්, සිල් ගුණ සයුර මැණිය නොහැකිය ගණනින්' සේ ප්‍රසිද්ධ වැකියක් තිබෙයි.

කාරුණික දෑසින් සියළු සත්වයන් දෙස බලන කල අසීමිත වූ වාසනාවක් එක් රැස් වන බව මෙහි සදහන් කරයි. එසේ කාරුණික දෑසින් ලෝකය හා මිනිසුන් දෙස බැලීමට අවශ්‍ය වන්නේ මොනවාද?

එයට හොදම පිලිතුර බුදු දහමේ සත්‍යය තුලින් පැහැදිලි කරන්නේ, ජූනි මාසයේ ධර්ම පණිවුඩය තුලද සදහන් කල ප්‍ර සිද්ධ කවියෙකු වන සන්සෙයි යමාඔ මහතාගේ 'අවලෝකීතේෂ්වර බෝධිසත්වයන් වහන්සේ' නම් කවි පන්තිය තුලදීය. එහි කොටසක් සදහන් කරන්නම්.

අවලෝකීතේෂ්වර බෝධිසත්වයන් යනු,
මේ ලෝකය පුරා ගලා යන පුළුල් දයාවේ හදවත වේ
මා තුලද ඇති පුළුල් දයාවේ හදවත වේ
-----------------------
එකිනෙකා මට සතුට ලබා දෙන්නේ නම්
එම තැනැත්තා අවලෝකීතේෂ්වර බෝධිසත්වයන් වේ
එක් ගසක් මට සිසිලස දෙන්නේ නම්
නොවැරදීම එම ගසද අවලෝකීතේෂ්වර බෝධිසත්වයන් වේ
----------------------
මම කාටත් නින්ද නොකරයි නම්
එයද අවලෝකීතේෂ්වර බෝධිසත්ව ගතියක් වේ
ඔබ මට සමාව දෙන්නේ නම්
එයින්ද අවලෝකීතේෂ්වර බෝධිසත්වයන් දෘෂ්‍යමාන වේ
අවලෝකීතේෂ්වර බෝධිසත්වයන් යනු
ලෝකය පුරා ගලා යන පුළුල් දයාවේ හදවත වේ
ඔබ තුලද ඇති, මා තුලද ඇති
පුළුල් දයාවේ හදවත වේ

(සන්සෙයි යමඔ මහතාගේ kannonkiyO no mori wo aruku ග්‍රන්ථය ඇසුරිනි)

මෙය එක පාරක් කියවූ පමණින් බුද්ධ ශක්තිය අවධි කරගත හැකි විශිෂ්ට කවි පන්තියක් යැයි සිතමි. 'වැදගත්ම දේ ඇත්තටම තේරුම් ගත යුතුයි' යන කතුවරයාගේ දයාවේ ප්‍රාර්ථනය මෙලෙස ප්‍රඥාව බවට පත්ව, ඉතා සරළ අයුරින් ධර්මයේ සත්‍යතාව කියාදෙන මෙම නිර්මාණය බිහිවුනා යැයි සිතමි.

'සියළු සත්වයන් දෙස කාරුණික දෑසින් බැලීම' යන්නෙහි අරුත මෙම කවිය පාදක කරගෙන බලනවා නම්, අපි කා තුලත් අවලෝකිතේෂ්වර බෝධිසත්වයන් වහන්සේ හා සමානවම පුළුල් දයාවේ හදවතක් තිබෙන බව දැකිය යුතුය. එසේම, අපි එකිනෙකා වෙනස් ආකාරයට ජීවිතය ගත කලත්, සමස්තයක් ලෙස අපි හැමෝගෙම ජීවිතයේ පදනම වන්නේ විශ්වයේ මහා ජීව ශක්තියයි. එලෙස අපි එකිනෙකා විශිෂ්ට වූ ජීවයක් ලබා ඇති බව දැකිය යුතුය. එයයි, අසීමිත වූ වාසනාවට ආමන්ත්‍රණය කරන දයාවේ දෑස වන්නේ.

## දෙපාමුල ආලෝකමත් කරන එළිය

ප්‍රසිද්ධ නවකතා කරුවෙකු වන වහෙයි තතෙමත්සු මහතා විසින්, නන්දයි නම් තොච්ගි පාලතේ පිහිටි පූජනීය කන්ද නැගීමට ගිය අවස්ථාවක වූ සිදු වීමක් මෙසේ සදහන් කර ඇත.

විදුලි පන්දමක්වත් නොමැතිව කන්දට නැග්ගත්, ඉර බැස යාමට ප්‍රථම කන්දෙන් බැසීමට පමා වීමෙන්, අඳුර නිසා කඳුකර පාරේ ඇවිදීමට ඉතා අපහසු වුවා. ඈතට වන්නට චුසෙන්ජි වැවත්, වැව් තාවුල්ල අසළ පිහිටි කඩ සාප්පු හා නවාතැන් පොලවල් විදුලි පහන් ආලෝකයෙන් දිඳුලනවා වුවත්, කඳුකරය ඝන අන්ධකාරය වෙළා ගනිමින් සිටියි. එම අවස්ථාවේ අපි ඉදිරියෙන් ඉතා කුඩා එළියක් දිස්වුනා. ඒ කන්දේ පාර අද්දර වෙහෙසට පත්ව බිම ඉදගෙන සිටින කාන්තාවකගේ ලඟ තිබෙන විදුලි පන්දමේ පොඩි එළියයි. අපි ඒ කාන්තාව ළඟට සමීප වී, ඇයගේ ගමන් ඔසවා ගනිමින්, ඇය ළඟ තිබුන ඉතා කුඩා විදුලි පන්දමේ ආලෝකයෙන් දෙපා මුල ආලෝකමත් කරමින්, කන්දෙන් පහලට බැස ආවා.

තතෙමත්සු මහතා මෙසේද සදහන් කරයි, 'එම කාන්තාවට අපි අවලෝකිතේෂ්වර බෝධිසත්වයන් විය. මන්ද ඇයගේ ගමන් මලු ඔසවගෙන කන්දෙන් පහලට බැස්ස බැවිනි. අපගේ දෙපාමුල අලෝකමත් කර ගැනීමට හැකිවුනේ ඇයගේ විදුලි පන්දමෙන් නිසා, අපිටද ඇය අවලෝකිතේෂ්වර බෝධිසත්ව වරියකි. ඈතින් කොපමණ ආලෝකය තිබුණත්, කිසි ප්‍රයෝජනයක් නොමැත. නමුත් සුළු හෝ ආලෝකයක් අපි ඉදිරියේ තිබෙනම්, එය ඉමහත් වූ ප්‍රයෝජනයක් ගෙනදෙයි.' අනුකම්පාව හා අන්‍යයන් ගැන සිතීම යන සියුම් ආලෝකය තුලයි, බෝධිසත්වයන්ව දිස්වන්නේ.

එලෙස අවලෝකිතේෂ්වර බෝධිසත්වයන් වහන්සේ සෑම විට නොයෙකුත් ස්ථාන වලට පැමිණ, තම දෑත දිගු කරමින් දුකින් මුදවා ගන්නා බව සූත්‍රයෙහි සදහන් වේ. එයට සමාන වැකියක් 'තථාගතයන් වහන්සේගේ සදාතන ජීවිතය පිලිබඳ විවරණය' වන 16 වන පරිච්ඡේදයේ ඇත. එනම් 'කෙසේ නම් සියළු සත්වයින් ශ්‍රේෂ්ඨ වූ මාර්ගයට පිවිසවන්නේ කියා ඔවුන්ගේ බුදුබව ක්ෂණිකව පිරිපුන් කරන්නේද' යන බවයි. මෙසේ අපි එකිනෙකා, අන්‍යයන් ගැන සිතන්නේ නම් එතැන විශාල බෝධිසත්වයන් පිරිසක් බිහිවී, සැවොම සතුටට පත්වන බව කියාදෙන මෙම පරිච්ඡේදයේදී, ධෛර්යය හා දුකින් මිදීමට ශක්තියත් ලබාදෙයි.

From *Kosei*, July 2020.

# නිර්මාතෘ තුමාගේ ධර්ම දේශනාවන්ගෙන් ලැබූ ප්‍රබෝධය

කියෝකෝ වෙකර්ස්කි මහත්මිය
ෆ්ලෝරිඩා කණ්ඩායම, නිව්යෝර්ක් ධර්ම ශාඛාව

මෙම සෙප්පෝව 2020 නොවැම්බර් වන මස 15 වන දින නික්යෝ නිවානෝතුමාගේ ජන්ම දිනය නිමිති කොටගෙන නිව්යෝක් ධර්ම ශාඛාවේදී පැවැත්වූ උත්සවයේදී ඉදිරිපත් කරන ලද්දකි.

බුදුරජාණන් වහන්සේ, නික්යෝ නිවානෝ තුමා, නිච්කෝ නිවානෝ තුමාගෙන් අවසරයි. නික්යො නිවානෝ තුමාගේ ජන්ම දිනය සැමරීම යන විශේෂිත දවසක සෙප්පෝව ඉදිරිපත් කිරීමට ලැබීම ගැන හදවතින්ම ස්තූතිවන්ත වෙනවා.

මම කෝසෙයිකායි සංවිධානයට සම්බන්ධ වුනෝ දැන් ජීවිතුන් අතර නැති වුනත් මාගේ නැන්ද නිසායි. මම රිෂ්ෂෝ කෝසෙයි කායි සංවිධානයේ කෝසෙයි සඟරාව මුල් වතාවට දුටුවේ ප්‍රාථමික වසරේ අධ්‍යාපනය ලබන කාලයේයි. එම සඟරාව කෝසෙයි කායි සාමාජිකත්වය ලබා සිටි නැන්ද, මගේ ආච්චිට දී ආච්චී ගෙදරට ගෙනවිත් තිබු සඟරාවකි. මම සඟරාව විවෘත කර බලන විට නික්යෝ නිවානෝ තුමා සිනාමුසු මුහුණින් ඉන්න ඡායාරූපයකුත්, ධර්ම කරුණුත් ලියා තිබුණා.

1977 වර්ශයේ විශ්ව විද්‍යාලයේ 1 වන වසරේ සිටි කාලයේ මම නැන්ද සමඟ පළමුවතාවට ඔකිනාවා ධර්ම ශාඛාවට ඇතුල්වුනා. එදින, තරුණ ගැහැණු ළමයෙක් ඉදිරිපත් කළ සෙප්පෝව අසා, විශ්මයට පත් වූ මම සාමාජිකත්වය ලබාගත්තා.

ඉන්පසු, ධර්ම ශාඛාවේ පැවැත්වෙන ගොමෙයිනිච් වැඩසටහන් මුලස්ථානයේ පැවැත්වෙන උත්සව වලදී නිකයෝ නිවානෝ තුමාගේ ධර්ම දේශනා වීඩියෝ පට තුලින් නරඹමින් ධර්මය ඉගෙන ගැනීම ට අවස්ථාව ලැබුනා. නික්යෝ නිවානෝතුමාගේ ඒ කරුණාවන්ත සරල සිනහව, හොඳින් තේරුම් ගැනීමට පහසු අයුරින් වචන භාවිතා කරමින් කතා කරන ආකාරය, එවගේම හදවතින්ම අන් අය ගැන සිතමින් නිහතමානී පෞර්ෂයකින් කටයුතු කරන නිසා එතුමන් සැම විටම අන් අයගේ ආදර ගෞරවයට පාත්‍රවුනා.

නික්යෝ නිවානෝතුමාගේ පෞර්ෂයය, තමාගේ ගම වන සුගනුමා වලින් වර්ධනය වුවා යැයි මම අසා තිබෙනවා. එතුමා ඉපදී හැදී වැඩුනු සුගනුමා ගම නීගනා ප්‍රාන්තයේ අධික හිම පතනයක් වැටෙන කඳු හා වනාන්තර වලින් පිරි ප්‍රදේශයකි. එහි වාසය කල ගම්වාසීන් කුඩා කල සිටම එකිනෙකාට උදව් කරගනිමින් සහයෝගයෙන් යුතුව, දෙවියන් බුදුන් ඇදහීම තම ජීවිතයේ අංගයක් ලෙස කටයුතු කරමින් පැමිණියා. නික්යෝ නිවානෝ තුමන් සැම දිනයකම දැත් එක්කර දෙවියන් බුදුන් නැමද පාසලට ගියා යැයි අසා තිබෙනවා. තවද සුගනුමා වල නික්යෝ නිවානෝතුමාගේ ශ්‍රේෂ්ඨ ගුරුවරුන් සිටියා. එනම්, නික්යෝ නිවානෝ තුමාගේ සීයා, දෙමාව්පියන් සහ පාසල් කාලයේ විදුහල්පති යන අය එතුමාගේ ජීවිතය වෙනස් කර ගැනීමට විශාල රුකුලක් වුන අය වේ. සීයා එතුමාට කුඩා කල සිටම 'මිනිසුන්ට වගේම ලෝකයට වැඩදයි පුද්ගලයෙකු වෙන්න' යැයි සැම විටම පැවසුවා.

නික්යෝ නිවානෝ තුමා ඔකිනාවා ධර්ම ශාඛාවට පැමිණි අවස්ථාවකදී මට පළමු වතාවට, එතුමාගේ සිනාමුසු මුහුණ සැබහින් දැකගැනීමට හැකිවුනා. ඒ අවස්ථාවේ නික්යෝ නිවානෝ තුමාගේ සිනාමුසු මුහුණ දැකීමෙන් පමණක් මට ඇතිවුන ප්‍රීතිමත් හැඟීම නිසා එතුමා කතා කල කිසිවක් මතක සිටියේ නැහැ.

නික්යෝ නිවානෝ තුමාගේ ධර්ම ඉගැන්වීම් අසා මම සැම විටම විශ්මයට පත්වුනා. ඇමරිකන් ජාතික මාගේ සැමියා සමග විවාහ වීමෙන් පසු, 1978 වසරේදී මම ඇමරිකාවට ගිය දිනයේ සිට, නිවසේ සිට රිෂ්ෂෝ කෝසෙයිකායි ධර්ම ශාඛාව දුරින් පිහිටා තිබු නිසා නිතරම ශාඛාවට යාමට නොහැකි නිසා, සැම මසකම කියාදෙන නික්යෝ නිවානෝතුමාගේ ඉගැන්වීම් මගේ ජීවිතයේ මාර්ගෝපදේශ ලෙස පිළිපදිමින් කටයුතු කලා. නිවනෝතුමා ජීවිතක්ෂයට පත්වීමෙන් පසුවත් මම එතුමා රචනා කල පොත්, සඟරා ආදිය කියවීම සිදුකලා. එතුමාගේ ඉගැන්වීම් අතරින් මම වඩාත් විශ්මයට පත් වූ ඉගැන්වීම වනුයේ 'බුද්ධ



ෆෝර්ට් මියර් ප්‍රදේශයේ බුද්ධ රූප තැන්පත් කිරීමකට සහභාගී වීම
(දකුණු පැත්තේ)

ස්භාවයට ගෞරව කරමින් වැඩිදියුණු කර ගැනීම සහ අපට පැවරී තිබෙන රාජකාරිය' යන කියමන, 2007 වර්ශයේ නිව්යෝක් ධර්ම ශාඛාවේ කියෝකයිචෝ ලෙස සිටි නගමොනෝ කෝයිචි කියෝකයිචෝ සාන් සහ, නිව්යෝක් ධර්ම ශාඛාවේ කාර්යය මණ්ඩලය විසින් සම්පාදනය කල කුඩා සඟරාවේ (Living Lotus, vol. 1, vol. 2) පලවී තිබුනා. 1956 වසරේ 10 වන මස, බොහෝ කාලයකට පෙර පලවී තිබු දෙයක් වුනත්, මම එම ධර්ම උපදේශය තුලින් මාව වෙනස් කර ගැනීමට හැකිවී, ඉන්පසු මම එම පණිවිඩය නැවත නැවත කියවීම සිදුකලා.

එම කාලය අපගේ පවුලට ආර්ථිකමය වශයෙන් ඉතා දුශ්කර කාලයක් වුනා. අපි 1994 වසරේ අග භාගයේදී ෆ්ලොරිඩා වලට පදිංචියට ගොස්, කාලයක් ගතවුනත් සැමියාගේ රැකියාවේ ස්ථිරත්වයක් නැතිව, මම පවුලේ මුදල් අඩුපාඩු පියවා ගැනීමට රැකියා 2 ක්ම සිදුකලා. සැමියා ඒ ගැන කේන්තියෙන්, මත්පැන් පානය කිරීමට පටන්ගත්තා. මේ වගේ දුක්බර කාලයක් ගත කල නිසා, 'සැපපහසුව වේදනාවේ බීජයයි, වේදනාව සැප පහසුවේ බීජයයි' යන උපුටාගත් කියමනෙන් ආරම්භ වන ධර්ම පණිවිඩයට මාගේ හිත ආකර්ශනය වුනා. 'දුක් වේදනාව තිබෙන නිසා සතුට අත්විඳිය හැකිවේ. සතුටක් යැයි සිතා සිටි දේ වේදනාවක් බවට පත් වේ. එසේම වේදනාවක් දුකක් යැයි සිතා සිටි දේ සතුටක් බවට වෙනස්වේ' යන ධර්ම පණිවිඩයයි. නික්යෝ නිවානෝතුමා අපට හුරුපුරුදු උදාහරණ තුලින් පහත පරිදි අපට තේරුම් ගැනීමට පහසු ආකාරයට පැහැදිලි කර දෙනවා.

'සෑම විටම ධර්ම ශාඛාව තුල විශාල පිරිසක් වාඩිවී සිටිනවා. වාඩිවී සිටීම, හිටගෙන සිටින පුද්ගලයෙක් හා සංසන්දනය කිරීමේදී සුවපහසුයි. හිටගෙන සිටින පුද්ගලයාට එය තරමක් අපහසු දෙයක්. එසේම දීර්ඝ වේලාවක් වාඩි වී සිටිනවිට එයද අපහසු තත්වයකට පත් වේ. වාඩිවී සිටීම සුවපහසු දෙයක් වුනත්, දිගටම වාඩිවී සිටීමෙන් එය දුකක් බවට පත් වේ. එයම අනික් අතට සිටගෙන සිටීම වේදනාවක් වුනත් වාඩි වුනොත් සුවපහසු යැයි සිතමින් සුවපහසුව වැඩි කරගැනීමට ගිය විට එයත් දුකක් බවට පත්වී, දුක් වේදනාව විඳිමින් යන විට සුවපහසුවට පත්වේ.'

නික්යෝ නිවානෝතුමා ඉගැන්වූ එම කියමන, මම පහත ආකාරයට අවබෝධ කරගත්තා.

'මේ මුළු ලෝකයම දුකින් පිරී තිබෙන බව බුදුන් වහන්සේ දේශණා කර තිබෙනවා. ඒ වාගේම එම දුක, සතුටක් බවට පත් කර ගත හැකි ආකාරය අපට පැහැදිලි කර දීම සඳහා අසූහාරදහසක් වූ ධර්ම ස්කන්දය දේශණා කලා. නමුත් දුක නැති කිරීමේ මේ මර්ගය ප්‍රායෝගිකව පුරුදු පුහුණු කිරීම තරමක් අපහසු දෙයක්. තම හදවතේ අපිරිසිදු දෑ පිරිසිදු කරමින් ධර්මය පුරුදු පුහුණු කරමින් යනවානම්, ඕනෑම දුෂ්කර දෙයකට සාර්ථකව මුහුණ දිය හැකිය. ධර්මය අසමින් ධර්මයේ හැසිරෙනවානම් ඉදිරි අනාගතය සතුටින් ගත කල හැකි වේ. සද්ධර්ම පුණ්ඩරික සූත්‍රය සම්පූර්ණයෙන් දැන නොසිටියත් සෑම උදෑසනකම සූත්‍ර සජ්ජායනා කරමින්, නව සාමාජිකයන්ව මිච්බිකි කරමින්, සෑම විටම ස්තූතිවන්තව බුදුන් වහන්සේගේ ධර්මය කිසි විටකත් අමතක නොකර කටයුතු කිරීම ධර්මය හොඳින් පුරුදු පුහුණු කිරීමවේ.'

ධර්මය ඉගෙනීමෙන් පසු, මෙතෙක් කල් දුකක් යැයි සිතා සිටි දෙයක් දෙස බලන ආකාරය සම්පූර්ණයෙන් වෙනස් වී එය භාරගැනීමට හැකි තත්වයට පත්වුනා. 'ඇයි මගේ සැමියාට මෙතෙක් කල් හොඳ රැකියාවක් හමු නොවුනෙ යැයි අසතුටින් සිටියත්, මට ලැබුනු මේ අවස්ථාව තමන් ගැන පසු විපරම් කර බැලීමට ලැබුනු අවස්ථාවක් යැයි' සිතුනා. මාගේ දුකට හේතුව මට ටිකෙන් ටික පෙනෙන්නට වුනා. මම සෑම දෙයක් ගැනම වැරදියට සිතමින්, කරනා රැකියාව අනුව පුද්ගලයන් වර්ගකරමින් සිටියා. රැකියාව උස් පහත් යැයි සිතමින්, උසස් තාක්ෂණයක් සහ ඉහළ සුදුසුකම් අත්‍යවශ්‍ය නොවන රැකියා පහත් යැයි සිතුවා. නමුත් මාගේ හදවත පසු විපරම් කර මම වැරදි යැයි තේරුම් ගත් පසු ඉදිකිරීම් අංශයේ, වෙළඳසැල් වල වැඩකරන අය ඇතුළුව කුමන රැකියාවක හෝ නිරතව සිටින සියළු දෙනා ඉතාම විශිෂ්ඨය යැයි සිතුනා. එයින් පසු මමරැකියාව කරන හෝටලයේ පිරිසිදු කරන, පිඟන් කෝප්ප සෝදන සියලු දෙනාටත් කාර්ය මණ්ඩලයේ සියළු දෙනාටත් හදවතින්ම ස්තූතිවන්ත වීමට හැකි වුනා.

ඒ වාගේම මාගේ තව වෙනස් වීමක් නම්, කිරීමට අපහසු අකමැති දේ වලටත් මුහුණ දීමට හැකි බවට පත් වුනා. මම සිතා සිටි දේ ඒ ආකාරයටම සිදු නොවේනම් මම දුකින් අසතුටින් කාලය ගතකලා. එවන් මම නික්යෝ නිවානෝ තුමාගේ ඉගැන්වීම් තුලින් ලොකු ශක්තියක් හා ප්‍රබෝධයක් ලැබුවා. 'අපි සෑම දෙනාම සාමාන්‍ය මිනිසුන්



පවුලේ සාමාජිකයන් සමඟ (මැද)

නිසා වයසට යමින් ලෙඩ වෙමින් අවසානයේදී අනිවාර්යයෙන්ම මරණයට පත් වෙනවා. නමුත් බුදු දහමට අනුකූලව කල්පනා කිරීමේදී මේ එකක්වත් දුකක් නොවේ. සූත්‍ර පොතේ සදහන් වන පරිදි, ආරම්භයේදී අපි මේ ඉපදීම වයසට යාම ලෙඩ වීම මරණයට පත්වීම යන සතර දුක් වලට දුක් වන නමුත්, ධර්මයේ හැසිරීම තුලින් බුද්ධතවය ලබා ගැත හැකි වේ' යැයි නික්යෝ නිවානෝතුමා දේශණා කර තිබෙනවා දුක්බර කාල වලදී සෑම විටම නික්යෝ නිවානෝත මාගේ ඉගැන්වීම් ඉගෙන ගනිමින් 'දැන් දුකින් කනස්සල්ලෙන් සිටියත්, එය සතුටක් බවට පත් කරගෙන, ස්තූතිවන්ත හැඟීමන් යුතුව කටයුතු කරමු' යන්න මටම කියා ගනිමින් කටයුතු කරනවා.

නව කෝරෝනා වෛරස ව්‍යාප්තියෙන් පසු, මෑතක සිට මාගේ සැමියා මත්පැන් භාවිතය නවතා දැමුවා. සැමියාගේ බීමත් කම නිසා මම දීර්ඝ කාලයක් දුකින් සිටියා. ධර්ම ශාඛාවේ සාමාජිකයන් මාගේ හදවත තේරුම් ගෙන, මට ඇහුන්කන් දෙමින් අවුරුදු ගනනාවක සිට මට උදව් කරමින් මාව දිරිමත් කලා. සැමියාගේ වකුගඩු වල ක්‍රියාකාරීත්වය 58% කින් නරක අතට හැරී ඇති බව වෛද්‍යවරයා පැවසුවා. එසේම දියවැඩියා තත්වයත් තිබෙන නිසා කෝරෝනා වෛරස ආසාධනය වීමේ ප්‍රවනතාව වැඩි බව දැනගත් මාගේ සැමියා මත්පැන් භාවිතය සම්පූර්ණයෙන් නවතා දැමුවා. 'හොද ශරීර සෞඛ්‍යයෙන් පසු වීමත් ඉබේම සිදුවන්නක් නොවේ යැයි වටහා ගෙන  දැන් පෙරටත් වඩා ජීවිතය ගැන සිතමින් කටයුතු කරන බව' සැමියා පැවසුවා. මෑතකදී සිට අප දෙදෙනා නිදහසේ ඇවිදිමින්, විවිධ දේ මිලදි ගනිමින්, නොයෙක් දේ කතා කරමින් විනෝද වෙමින්, කුඩා දෙයකින් වුවද විශාල සතුටක් ලබමින් ජීවත් වීමට හැකි වීම ගැන හදවතින්ම ස්තූතිවන්ත වනවා.

කෝසෙයි කායි සංවිධානයේ 2020 වසරේ 11 වන මස නිකුත් වූ 'යකුෂින්' මාසික සඟරාවේ නික්යෝ නිවානෝ තුමාගේ පණිවිඩය තුල, 'තමාව වෙනස් කර ගැනීම' යැයි ලියවී තිබුනා. 'තමා අවට සිදුවන සෑම දෙයක්ම හොද ආකාරයට පත්කර ගැනීමට ක්‍රමයක් තිබෙනවා. එය නම්, අප අවට සිදුවන දේ වෙනස් නොකර, තමා වෙනස් වීමයි. එසේ කල විට, යම් කිසි දවසක අවට සිදුවනදේත් වෙනස් වේ.'

තමාව වෙනස් කර ගැනීම ලෙහෙසි පහසු දෙයක් නොවේ. මින් ඉදිරියටත් අපිට නොයෙක් දේ වලට මුහුණ දීමට සිදු වෙනවා. නමුත්, සෑම විටම තමා ගැන නැවත නැවත පසු විපරම් කරමින් කටයුතු කිරීම වැදගත්වේ. බුදුන් වහන්සේගේ ධර්මයත්, නික්යෝ නිවානෝතුමාගේ ඉගැන්වීමුත් හදවතේ තැන්පත් කරගෙන, පවුලේ අයත් සාමාජික සියළු දෙනාත් සමග බෝධිසත්ව චර්යයාවේ යෙදෙමින් කටයුතු කරනවා.

ඔබ සියළු දෙනාටම බොහොම ස්තූතියි.

# සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ
## සාරාංශය හා වැදගත් කරුණු

කර්තෘ: නික්යෝ නිවානෝ

## සමන්ත්‍ර භද්‍ර බෝධිසත්වයන් මෙනෙහි කිරීම පිළිබඳ සූත්‍රය



සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ, සමන්ත්‍ර භද්‍ර බෝධිසත්වයන්ගේ ධෛර්යය යන 28 වන පරිච්ඡේදයෙන් පසුවත් සමන්ත්‍ර භද්‍ර බෝධිසත්වයන් වහන්සේව මූලික කරගෙන මෙම සූත්‍රය දේශනා කර ඇත.

මෙම සූත්‍රය තුලදී පසුවිපරම් කිරීමේ වැදගත්කම සදහන් කර ඇති නිසා, පසුවිපරම් කිරීමේ සූත්‍රය ලෙසද මෙම සූත්‍රය හඳුන්වයි.

### සමන්ත්‍ර භද්‍ර බෝධිසත්වයන් මෙනෙහි කිරීම

මෙම පරිච්ඡේදයේ මාතෘකාවේ සදහන් 'සමන්ත්‍ර භද්‍ර බෝධිසත්වයන් මෙනෙහි කිරීම' යනු, සමන්ත්‍ර භද්‍ර බෝධිසත්වයගේ 'ක්‍රියාවන්' තුලින් ලැබෙන ආනිශංස හොඳින් ග්‍රහණය කරගැනීම තුලින්, එම ආධ්‍යාත්මය තම හදවත හා බද්ධවීමෙන්, බුද්ධ මාර්ගය ස්ථාවර වී, සමන්ත්‍ර භද්‍ර බෝධිසත්වයන් හා සමානව කටයුතු කල හැකි තත්වයට පත්වන ධර්ම පුහුණුවේ ක්‍රියාවලිය වේ.

මෙම පරිච්ඡේදය තුලදී කිහිප වරක්ම 'සමන්ත්‍ර භද්‍ර බෝධිසත්වයගේ ශරීරය දැකීම' ලෙසින් සදහන් වී ඇත්තේ, තම හදවත සමන්ත්‍ර භද්‍ර බෝධිසත්වයගේ ආධ්‍යාත්මය සමඟ එකට බද්ධ කල යුතු බව වේ. එම තත්වයට තවමත් පත්වී නොමැති වුවත්, ධර්මය පුරුදු පුහුණු වීමේ අඩුපාඩු ගැන පසුවිපරම් කිරීම හා නැවත එම වැරදි සිදු නොවීමට වගබලා ගැනීම වැදගත් බවයි.

එසේම, 'සමන්ත්‍ර භද්‍ර බෝධිසත්වයගේ ශරීරය දැකීම' කිරීමට හැකි වුවත්, ඒ ගැන තෘප්තිමත් නොවී, මිළඟ 'බුදුන් දැකීමට' උත්සහ කලයුතු බව සදහන් වේ. මන්ද, බුදුන්ගේ ආධ්‍යාත්මය හා තම ආධ්‍යාත්මය බද්ධ කිරීමට හැකිවීම තුලින් අපගේ ධර්ම පුහුණුව අවසන් වන නිසාය.

### පසුවිරපම අවසාන වන්නේ යථාර්තය දැකීමෙනි

'ඔබට ඉන් මිදෙන සිත් ඇත්නම්, ඇති සැටි සොබා ගැන වඩනුයේ' සේ සූත්‍ර පොතෙහිද සදහන් ආකාරයට, සෑම සියළුදෙයකම යථාස්වරූපය දැකීම පලමු න්‍යාය වේ. සය ඉන්ද්‍රියන් ගැන පසුවිපරම් කිරීමෙන් පසුව, ඒ ගැන හදවතින්ම සිතා බලන්නේ නම්, බුදුන් වහන්සේගේ හදවත හා බද්ධ විය හැකි වනවාසේම, සියළු පාපයන් පිණි බිඳු මෙන් ප්‍රඥාවේ ආලෝකයෙන් දුරු වී යන බව සදහන් වේ.



## ගිහි බෞද්ධයන්ගේ පසුවිපරම් කිරීමේ පුහුණුව

මෙහි අවසානයට බුදුන් වහන්සේ විසින් ගිහි බෞද්ධයන් විසින් පසුවිපරම් කිරීමේ ප්‍රායෝගික පුහුණුව කළ යුතු ආකාරය ගැන සඳහන් කරයි.

1. ත්‍රිවිධ රත්නයට ගෞරව කිරීම, භික්ෂූන්ට බාධා නොකිරීම, ෂඩ් පාරමිතාවන්ගේ ප්‍රත්‍යාවේක්ෂණය කිරීම, සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය වැළඳ ගත්තවුනට ගෞරව කිරීම, සූත්‍ර ධර්මයේ මූළ ධර්මය පිළිබඳ මෙනෙහි කිරීම.

2. දෙමාපියන් වෙනුවෙන් යුතුකම් ඉටුකිරීම, ගුරුවරු හා වැඩිහිටි අයට ගෞරව කිරීම.

3. රාජ්‍ය පාලනය දශරාජ ධර්මයන්ට අනුකූලව, රට වැසියන්ට අසාධාරණයක් නොවන ලෙස පාලනය කිරීම. (දේශපාලඥයින් සාමානාත්මතාවයෙන් යුතුව නිවැරදි දේශපාලනයේ නිරත වීම. ආයතනයක නායකයින් තමා යටතේ සිටින අයට නිවැරදි මඟපෙන්වීම)

4. ප්‍රාණ ඝාතයෙන් වැලකී, සියළුම ජීවයන්ට ගෞරව කිරීම

5. ප්‍රතීතය සමුද්පාදය ගැඹරින් විශ්වාස කර, බෝධිසත්ව මාර්ගයද විශ්වාස කරමින්, සදතනික බුදුන් වහන්සේ නිතරම තමා සමග සිටිමින් පරිණිර්වාණයට පත්නොවන බව දැනගැනීම.



## සාරාංශය

ඉහත පසුවිපරම් කල යුතු පුහුණුව ගැන සදහන් කල කරුණු 5, වර්තමාන සමාජය තුලද, අපි එකිනෙකා ප්‍රායෝගික පුහුණු විය යුතු වැදගත් කරුණු වේ. විශේෂයෙන්ම 5 වෙනියට සදහන් කල, 'ප්‍රතීත්‍ය සමුද්පාදය පිළිබඳව පරම සත්‍යතාව සහ බුදුන් වහන්සේ පරිනිර්වාණයට පත්නොවන බව ගැඹුරු ලෙස දැනගැනීම' වදන තුල බුදු දහමේ සම්පූර්ණ අන්තර්ගතය ගැබ් වී තිබේ. එය විශිෂ්ට ධර්ම පණිවුඩයකි.



'හේතු ප්‍රත්‍යයන්' යනු, හේතුව හා ඵලය ගැන සදහන් වන ප්‍රතිත්‍ය සමුප්පදය වෙනවා සේම, බුදු දහමේ සැකිල්ල වේ.

'පරම සත්‍යය' යනු, එකම එක සත්‍යවූ මාර්ගය, බුදු බවට පත්වන මාර්ගය, බෝධිසත්ව මාර්ගය වේ. ධර්ම කරුණු නොයෙකුත් ආකාරයට තිබුණා වුවද, ඒ සියළු දෙයම සියළු සත්වයන්ට සත්‍යාවබෝධය ලබා දීම සදහා එකම එක පරම සත්‍ය තුලින් ගොඩනැගී තිබෙයි.

'බුදුන් වහන්සේ පරිණිර්වානයට පත්නොවන බව දැනගැනීම' යනු, සදතනික බුදුන් වහන්සේ ලෙසින් හදුන්වන සද්ධර්මය ඉපදීමක් හෝ මියයාමක් නොමැත. අපි සියළු දෙනාම සදතනික බුදුන් වහන්සේගේ (සද්ධර්මයේ) ආශිර්වාදයෙන් ජීවිතය ගත කරනවා යන සත්‍ය දැන ගැනීම වේ.

මෙම කරුණු 3 න හදවතින්ම විශ්වාස කරන්නෙ නම්, ඕනෑම මනුෂ්‍යයෙකුට සිතේ සැනසීම උදකර ගැනීමට හැකිවෙයි. එයයි නියම දුකින් මිදීම බවට පත්වන්නේ. මෙය සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ අවසානය සැරසිලි කරන විශිෂ්ට කියමනකි.

නික්යෝ නිවානෝ තුමා විසින් රචිත『සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ සාරාංශය හා වැදගත් කරුණු』ග්‍රන්ථය ඇසුරෙනි
කෝසෙයි මුද්‍රණ ආයතනයේ ප්‍රකාශනයකි. 2016, P225-P229





# Director's Column

## සෑම හමුවීමක්ම ආදරයෙන් රැකබලා ගැනීම


අන්තර්ජාතික මුලස්ථාන ප්‍රධානී
කෙයිචි අකගාවා මහතා


මේ මාසයේද නිචිකෝ නිවානෝ තුමාගේ මාසික ධර්ම පණිවුඩය තුල 'අවලෝකිතේශ්වර බෝධිසත්වයන් වහන්සේ' ගැන සඳහන් කරයි. ඒ තුලින් 'දයාවේ දෑසින් යුතුවීම' ගැන එතුමා කොපමණ වැදගත්ව සලකනවාද යන්න දැන ගැනීමට හැකිවේ. 'අසීමිත වූ වාසනාවට ආමන්ත්‍රණය කරන කරුණාවේ දෑස අපි කා තුලත් තිබෙන නිසා, දයානුකම්පාවෙන් හා අන්‍යයන් ගැන සිතමින් ජීවත්වෙමු' යන නිචිකෝ සෙන්සෙයිගේ හඬ ඇසෙනවා වේ.

මෙම වදන තුලින් 'සෑම හමුවීමක්ම ආදරයෙන් රැකබලා ගැනීමයි සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ සඳහන් වන්නේ' යනුවෙන් ඉතාමත් කාරුණිකව නිර්මාතෘ තුමා පැවසූ වදනද මතකයට නැගෙයි. එසේම නිචිකෝ නිවානෝ තුමාගේ හා කෝෂෝ නිවානෝ තුමියගේ වදන් වලින්, සෑම හමුවීමකදීම ගුණාත්මක භාවය වැඩි කල යුතු යැයි පවසන බවද හැගෙනවා.

මුළු ජපානය පුරාම සිටින ශාඛා ප්‍රධානීන් සමඟ අන්තජාලය හරහා කරන සුහද හමුවීම් වලදී, නිචිකෝ නිවානෝ තුමා විසින් සංවත්සර යෙදී තිබෙන ශාඛාවන්ගේ ප්‍රධානී තුමාලගෙන් 'සංවත්සරය කෘතවේදී ලෙසින් හැගෙනවාද' යනුවෙන් විචාරණ අවස්ථා බහුල වී තිබෙනවා යැයි දැනගන්නට ලැබුනා. කෝරෝනා වල බලපෑම නිසා සංවත්සර උත්සව ආදීය පවත්වන්නට හැකියාවක් නැහැ. සංවත්සර උත්සව පවත්වනකල් සතුටින් බලාගෙන සිටි සාමාජිකයන්ගේ හදවතට ශාඛා ප්‍රාධානීන් සමීප වී කටයුතු කිරීම වැදගත් යැයි සිතන නිසා නිචිකෝ සෙන්සෙයි එසේ විමසනවා විය යුතුයි. එසේම අප තුල තිබෙන 'දයාවේ දෑස' තදින්ම විශ්වාස කරන නිසාද විය හැකිය.

ඒ අනුව මමත්, එදිනෙදා ජීවිතයේ නොයෙකුත් අවස්ථා වලදී අන්‍යයන් සිටින තත්වය ගැන වඩා හොදින් හදවත යොමු කරන කටයුතු කිරීමට පුරුදු පුහුණු වෙමි.



We welcome comments on our newsletter Living the Lotus: living.the.lotus.rk-international@kosei-kai.or.jp

# Rissho Kosei-kai: A Global Buddhist Movement




**Rissho Kosei-kai Buddhist Church of Hawaii**
2280 Auhuhu Street, Pearl City, HI 96782, USA
TEL: 1-808-455-3212 FAX: 1-808-455-4633
Email: sangha@rkhawaii.org URL: http://www.rkhawaii.org

**Rissho Kosei-kai Maui Dharma Center**
1809 Nani Street, Wailuku, HI 96793, USA
TEL: 1-808-242-6175 FAX: 1-808-244-4625

**Rissho Kosei-kai Kona Dharma Center**
73-4592 Mamalahoa Highway, Kailua-Kona, HI 96740, USA
TEL: 1-808-325-0015 FAX: 1-808-333-5537

**Rissho Kosei-kai Buddhist Center of Los Angeles**
2707 East First Street, Los Angeles, CA 90033, USA
TEL: 1-323-269-4741 FAX: 1-323-269-4567
Email: rk-la@sbcglobal.net URL: http://www.rkina.org/losangeles.html

Please contact Rissho Kosei-kai Buddhist Center of Los Angeles
**Rissho Kosei-kai Buddhist Center of Arizona**
**Rissho Kosei-kai Buddhist Center of Colorado**
**Rissho Kosei-kai Buddhist Center of San Diego**
**Rissho Kosei-kai Buddhist Center of Las Vegas**
**Rissho Kosei-kai Buddhist Center of Dallas**

**Rissho Kosei-kai of San Francisco**
(Address) 1031 Valencia Way, Pacifica, CA 94044, USA
(Mail) POBox 778, Pacifica, CA 94044, USA
TEL: 1-650-359-6951 Email: info@rksf.org

Please contact Rissho Kosei-kai of San Francisco
**Rissho Kosei-kai of Sacramento**
**Rissho Kosei-kai of San Jose**

**Rissho Kosei-kai of New York**
320 East 39th Street, New York, NY 10016, USA
TEL: 1-212-867-5677 Email: rkny39@gmail.com URL: http://rk-ny.org

**Rissho Kosei-kai of Chicago**
1 West Euclid Ave., Mt. Prospect, IL 60056, USA
TEL: 1-773-842-5654
Email: murakami4838@aol.com URL: http://rkchi.org

**Rissho Kosei-kai of Fort Myers**
URL: http://www.rkftmyersbuddhism.org

**Rissho Kosei-kai Dharma Center of Oklahoma**
(Address) 2745 N.W. 40th St., Oklahoma City, OK 73112, USA
(Mail) POBox 57138, Oklahoma City, OK 73157, USA
TEL: 1-405-943-5030 FAX: 1-405-943-5303
Email: rkokdc@gmail.com URL: http://www.rkok-dharmacenter.org

**Rissho Kosei-kai Dharma Center of Denver**
1255 Galapago St. #809, Denver, CO 80204, USA
TEL: 1-303-446-0792

**Rissho Kosei-kai Dharma Center of Dayton**
617 Kling Drive, Dayton, OH 45419, USA
URL: http://www.rkina-dayton.com

**The Buddhist Center Rissho Kosei-kai International of North America (RKINA)**
2707 East First St., Suite #1, Los Angeles, CA 90033, USA
TEL: 1-323-262-4430 FAX: 1-323-269-4567
Email: info@rkina.org
URL: https://www.buddhistcenter-rkina.org

**Rissho Kosei-kai Buddhist Center of San Antonio**
(Address) 6083 Babcock Road, San Antonio, TX 78240, USA
(Mail) POBox 692148, San Antonio, TX 78249, USA
TEL: 1-210-558-4430 FAX: 1-210-696-7745
Email: dharmasanantonio@gmail.com
URL: http://rksabuddhistcenter.org

**Rissho Kosei-kai of Seattle's Buddhist Learning Center**
28621 Pacific Highway South, Federal Way, WA 98003, USA
TEL: 1-253-945-0024 Email: rkseattlewashington@gmail.com
URL: http://buddhistlearningcenter.org

**Rissho Kosei-kai of Vancouver**
Please contact RKINA

**Risho Kossei-kai do Brasil**
Rua Dr. José Estefno 40, Vila Mariana, São Paulo-SP, CEP 04116-060, Brasil
TEL: 55-11-5549-4446, 55-11-5573-8377
Email: risho@rkk.org.br URL: http://www.rkk.org.br

**在家佛教韓国立正佼成会　Korean Rissho Kosei-kai**
〒 04420 大韓民国 SEOUL 特別市龍山區漢南大路 8 路 6-3
6-3, 8 gil Hannamdaero Yongsan gu, Seoul, 04420, Republic of Korea
TEL: 82-2-796-5571　FAX: 82-2-796-1696

**在家佛教韓国立正佼成会釜山支部**
**Korean Rissho Kosei-kai of Busan**
〒 48460 大韓民国釜山廣域市南區水營路 174, 3F
3F, 174 Suyoung ro, Nam gu, Busan, 48460, Republic of Korea
TEL: 82-51-643-5571　FAX: 82-51-643-5572

**社團法人在家佛教立正佼成會　Rissho Kosei-kai of Taipei**
台湾台北市中正區衡陽路 10 號富群資訊大厦 4 樓
4F, No. 10, Hengyang Road, Jhongjheng District, Taipei City 100, Taiwan
TEL: 886-2-2381-1632, 886-2-2381-1633　FAX: 886-2-2331-3433

**台南市在家佛教立正佼成會　Rissho Kosei-kai of Tainan**
台湾台南市東区崇明 23 街 45 號
No. 45, Chongming 23rd Street, East District, Tainan City 701, Taiwan
TEL: 886-6-289-1478　FAX: 886-6-289-1488
Email: koseikaitainan@gmail.com

**Rissho Kosei-kai South Asia Division**
Thai Rissho Friendship Foundation
201 Soi 15/1, Praram 9 Road, Bangkapi, Huaykhwang, Bangkok 10310, Thailand
TEL: 66-2-716-8141　FAX: 66-2-716-8218

**Rissho Kosei-kai of Kathmandu**
Ward No. 3, Jhamsikhel, Sanepa-1, Lalitpur, Kathmandu, Nepal

**Rissho Kosei-kai Society of Kolkata**
89 Srirampur Road (VIP), Garia, Kolkata 700084, India

**Rissho Kosei-kai of Kolkata North**
AE/D/12 Arjunpur East, Teghoria, Kolkata 700059,
West Bengal, India

**Rissho Kosei-kai of Bodhgaya Dharma Center**
Ambedkar Nagar, West Police Line Road, Rumpur, Gaya-823001,
Bihar, India

**Rissho Kosei-kai of Patna Dharma Center**
Please contact Rissho Kosei-kai Society of Kolkata

**Rissho Kosei-kai of Central Delhi**
77 Basement D.D.A. Site No. 1, New Rajinder Nagar,
New Delhi 110060, India

**Rissho Kosei-kai of Singapore**
Please contact Rissho Kosei-kai International

**Rissho Kosei-kai of Phnom Penh**
W.C. 73, Toul Sampaov Village, Sangkat Toul Sangke, Khan Reouseykeo,
Phnom Penh, Cambodia

**RKISA Rissho Kosei-kai International of South Asia**
Thai Rissho Friendship Foundation
201 Soi 15/1, Praram 9 Road, Bangkapi, Huaykhwang, Bangkok 10310, Thailand
TEL: 66-2-716-8141　FAX: 66-2-716-8218

**Rissho Kosei-kai of Bangkok**
Thai Rissho Friendship Foundation
201 Soi 15/1, Praram 9 Road, Bangkapi, Huaykhwang, Bangkok 10310, Thailand
TEL: 66-2-716-8216　FAX: 66-2-716-8218　Email: info.thairissho@gmail.com

**Rissho Kosei Dhamma Foundation**
No. 628-A, Station Road, Hunupitiya, Wattala, Sri Lanka
TEL: 94-11-2982406　FAX: 94-11-2982405

**Rissho Kosei-kai of Polonnaruwa**
Please contact Rissho Kosei Dhamma Foundation

**Rissho Kosei-kai Bangladesh**
85/A Chanmari Road, Lalkhan Bazar, Chittagong, Bangladesh
TEL: 880-2-41360470

**Rissho Kosei-kai Mayani**
Mayani Barua Para, Mirsarai, Chittagong, Bangladesh

**Rissho Kosei-kai Damdama**
Damdama Barua Para, Mirsarai, Chittagong, Bangladesh

**Rissho Kosei-kai Satbaria**
Village: Satbaria Bepari Para, Chandanaih, Chittagong, Bangladesh

**Rissho Kosei-kai Chendhirpuni**
Village: Chendhirpuni, P.O.: Adhunogar, P.S.: Lohagara, Chittagong,
Bangladesh

**Rissho Kosei-kai Raozan**
Dakkhin Para, Ramzan Ali Hat, Raozan, Chittagong, Bangladesh

**Rissho Kosei-kai Laksham**
Village: Dhupchor, Laksham, Comilla, Bangladesh

**Rissho Kosei-kai Dhaka North**
408/8 DOSH, Road No 7 (West), Baridhara, Dhaka, Bangladesh

**Rissho Kosei-kai Cox's Bazar**
Ume Burmize Market, Tekpara, Sadar, Cox's Bazar, Bangladesh

Please contact Rissho Kosei-kai Bangladesh
**Rissho Kosei-kai Patiya**
**Rissho Kosei-kai Ramu**
**Rissho Kosei-kai Aburkhil**

**Buddiyskiy khram "Lotos"**
4 Gruzinski Alley, Yuzhno-Sakhalinsk 693005, Russia
TEL: 7-4242-77-05-14

**Rissho Kosei-kai of Hong Kong**
Flat D, 5/F, Kiu Hing Mansion, 14 King's Road, North Point, Hong Kong, China

**Rissho Kosei-kai Friends in Shanghai**
Please contact Rissho Kosei-kai International

**Rissho Kosei-kai of Ulaanbaatar**
(Address) 15F Express Tower, Peace avenue, khoroo-1, Chingeltei district,
Ulaanbaatar 15160, Mongolia
(Mail) POBox 1364, Ulaanbaatar-15160, Mongolia
TEL: 976-70006960　Email: rkkmongolia@yahoo.co.jp

**Rissho Kosei-kai of Erdenet**
Please contact Rissho Kosei-kai International

**Rissho Kosei-kai di Roma**
Via Torino, 29, 00184 Roma, Italia
TEL/FAX: 39-06-48913949　Email: roma@rk-euro.org

Please contact Rissho Kosei-kai di Rome
**Rissho Kosei-kai of Paris**
**Rissho Kosei-kai of Venezia**

**Rissho Kosei-kai of the UK**
29 Ashbourne Road, London W5 3ED, UK
TEL: 44-20-8933-3247　Email: info@rkuk.org　URL: https://www.rkuk.org
Facebook: https://www.facebook.com/rkuk.official
Twitter: https://twitter.com/rkuk_official
Instagram: https://www.instagram.com/rkuk_official

**Rissho Kosei-kai International Buddhist Congregation (IBC )**
166-8537 東京都杉並区和田 2-7-1 普門メディアセンター 3F
Fumon Media Center 3F, 2-7-1 Wada, Suginami-ku, Tokyo 166-8537, Japan
TEL: 03-5341-1230　FAX: 03-5341-1224　URL: http://www.ibc-rk.org

**Published by Rissho Kosei-kai International**